සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**84 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023 (2024)

ශිල්ප කලා I, II
நுண்கலை I, II
Arts and Crafts I, II

## ශිල්ප කලා II

※ **පළමුවැනි** ප්‍රශ්නය ද තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ද ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** ඔබ පාසලේ මෙවර පැවැත්වෙන නිවාසාන්තර මලල ක්‍රීඩා උත්සවයේ විසිතුරු කිරීමේ අවස්ථා සියල්ල ශිල්ප කලා අංශයේ සිසුනට පැවරීමට ක්‍රීඩා කමිටුව තීරණය කර ඇත.

(i) ක්‍රීඩා උත්සවය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීමට සුදුසු පෝස්ටරයක ආකෘතියක් ඇඳ දක්වන්න.

(ii) ආරාධිතයන් සඳහා යැවීමට ආරාධනා පත්‍රයක මුහුණතකට සුදුසු චිත්‍රයක් ඇඳ දක්වන්න.

(iii) වියමන් රටා ඇසුරින් නිවාස නාම සකස් කිරීමට යොදා ගත හැකි පන් වර්ග **දෙකක්** නම් කරන්න.

(iv) සමාරම්භක උළෙලේ නිවාස පුවරු රැගෙන යන ශිෂ්‍යයින්ගේ ඇඳුම් අලංකාර කිරීම සඳහා අච්චු මුද්‍රණ ක්‍රමයෙන් සකස් කර ගත හැකි මෝස්තරයක් චිත්‍රණය කර දක්වන්න.

(v) 'පරවි' නිවාසයේ සිසුන් හඳුනා ගැනීම සඳහා පැළඳීමට සුදුසු ලාංඡනයක රූප සටහනක් ඇඳ දක්වන්න.

(vi) සහතික පිරිනමන අවස්ථාවේ ක්‍රීඩකයින්ට දීමට යොදා ගන්නා, කෘත්‍රිම මල් සැකසුම් භාවිතයේ වාසි **දෙකක්** සඳහන් කරන්න.

(vii) විවේක කාලයේ දී නිවාස සාමාජිකයින්ට ලබා දෙන කෙටි ආහාරය අසුරාලීමට සුදුසු ඇසුරුමක රූපීය පෙනුම ඇඳ දක්වන්න.

(viii) තූර්ය වාදක කණ්ඩායමේ සාමාජිකයින්ට ගෙළ පැළඳීම සඳහා ආභරණ සැකසීමට යොදා ගත හැකි ස්වභාවික ඇට වර්ග **දෙකක්** ලියන්න.

(ix) නිවාස ධජයක් ඩිජිටල් මුද්‍රණය සඳහා රුපියල් අටසියයක් වැය වන අතර ධජ පහක් මුද්‍රණයේ දී 20% ක වට්ටමක් හිමි වේ. නිවාස ධජ පහ මුද්‍රණයට වැය වන මුදල ගණනය කරන්න.


(x) දක්ෂතම ක්‍රීඩකයින්ට/ක්‍රීඩිකාවන්ට පිරිනමන කුසලානය සඳහා සුදුසු ආකෘතියක් චිත්‍රණය කර දක්වන්න.

**2.** භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලියේ දී සැලසුම් චිත්‍ර නිර්මාණයට ජ්‍යාමිතිය හා යාන්ත්‍රික ඇඳීම භාවිතයට ගනු ලබයි.

(i) කවකටුව හා කෝදුව භාවිතයෙන් පාදයක් 4 cm වූ ABC සමපාද ත්‍රිකෝණය නිර්මාණය කරන්න.

(ii) 7 cm වූ AB රේඛාව ඇඳ A සිට 4 cm ක් දුරින් පිහිටි ලක්ෂ්‍යයට ලම්භකයක් නිර්මාණය කරන්න.

(iii) රූපයේ දක්වා ඇති සිලින්ඩරයේ නිවැරදි මිනුම් අනුව විකසන චිත්‍රය ඇඳ දක්වන්න.



**3.** ආකර්ෂණීය ලෙස නිම කරන ලද විසිතුරු භාණ්ඩ වර්තමාන වෙළෙඳපොළෙහි දක්නට ඇත.

(i) ගෘහ අලංකරණ ලෙස රිබන් එම්බ්‍රොයිඩර් ක්‍රමය භාවිතයේ දී යෙදෙන මැහුම් ක්‍රම **දෙකක්** ලියන්න.

(ii) කෘත්‍රිම ආභරණ නිර්මාණය සඳහා පාන්ක්ලේ මිශ්‍රණය සකස් කර ගන්නා ආකාරය දක්වා කෘමි උවදුරු වැළැක්වීම සඳහා යොදන ආරක්ෂිත ක්‍රමවේදයක් දක්වන්න.

(iii) තාප බන්ධිත ක්‍රමයට ඔබගේ පාසල් පොත් බෑගය අලංකාර කර ගැනීමට සුදුසු චිත්‍රයක් අඳින්න. එම ක්‍රමයට එය නිර්මාණය කර ගන්නා ආකාරය කෙටියෙන් දක්වන්න.

**4.** බඳුන් පලස් (Table mat) හැදයක් සකස් කර ගැනීමට අවශය නූල් හැදයක විස්තර පහත දැක්වේ.

* හැදයේ දිග මීටර් 50 කි.
* හැදයේ පළල සෙන්ටිමීටර් 20 කි.
* එක් සෙන්ටිමීටරයකට යොදන දික් නූල් ගණන 40 කි.
* දික් නූලේ අංකය $2^S$ / 40 ක් වේ.

(i) බඳුන් පලස් වියීමට සුදුසු වියමන් රටා **දෙකක්** නම් කරන්න.

(ii) ඉහත (i) හි ඔබ නම් කළ වියමන් රටා දෙකෙහි නූල් මතුවීම ප්‍රස්ථාරගත කර ඒවා නම් කරන්න.

(iii) බඳුන් පලස් හැදය වියීමට අවශ්‍ය දික් නූල්වල බර ප්‍රමාණය ගණනය කරන්න.

**5.** වර්තමානයේ රෙදි පිළි අලංකරණය සඳහා විවිධ අලංකරණ ක්‍රම භාවිත කෙරේ.

(i) අතින් පින්තාරු කිරීමේ දී දම් පැහැය ලබා ගැනීම සඳහා මිශ්‍ර කළ යුතු මූලික වර්ණ මොනවා ද?

(ii) මුද්‍රණය කළ රෙදිවල සායම් ස්ථිර කිරීම සඳහා කරනු ලබන පසුපිරියම් ක්‍රම **දෙකක්** සඳහන් කර එයින් **එකක්** පිළිබඳ කෙටි සටහනක් ලියන්න.

(iii) බතික් නිර්මාණයකට සුදුසු චිත්‍රයක් ඇඳ එය **එක්** වර්ණයක් භාවිතයෙන් අලංකරණය කරන ආකාරය විස්තර කරන්න.

**6.** ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට ම මැටි භාණ්ඩ නිෂ්පාදනය සඳහා උත්සාහ කර ඇති බව පැහැදිලිව දක්නට ඇත.

(i) මැටි නිර්මාණය වීම සඳහා බලපාන හේතු සාධක **දෙකක්** සඳහන් කරන්න.

(ii) මැටි පදම් කර ගන්නා ප්‍රධාන ක්‍රම **දෙක** සඳහන් කර ඉන් **එක** ක්‍රමයක් පැහැදිලි කරන්න.

(iii) මැටි තහඩු භාවිතයෙන් මල් බඳුනක් සකස් කර ගන්නා ආකාරය පියවර අනුව විස්තර කරන්න.

**7.** අප ජීවත්වන පරිසරය අලංකරණය කිරීම සඳහා විවිධ ක්‍රම භාවිත කෙරේ.

(i) උද්‍යාන අලංකරණ නිර්මාණ ශිල්පීය ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

(ii) කඩදාසි ආශ්‍රිත මැටි භාණ්ඩ අලංකාර කිරීමේ ක්‍රම **දෙකක්** දක්වා එයින් **එකක්** විස්තර කරන්න.

(iii) නිවසක අභ්‍යන්තරය අලංකරණයට සුදුසු මූර්තියක් සඳහා මාධ්‍යයක් නම් කර එම මූර්තිය නිර්මාණය කර ගන්නා ආකාරය විස්තර කරන්න.

* * *

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
## අ.පො.ස. (සා.පෙළ) විභාගය 2023(2024)
க.பொ.த (சா.தர)ப் பரீட்சை – 2023(2024)

| විෂයය අංකය<br>பாட இலக்கம் | 84 | විෂයය<br>பாடம் | ශිල්පකලා |
|---|---|---|---|

## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 02 | 11. | 03 | 21. | 02 | 31. | 03 |
| 02. | 01 | 12. | 02 | 22. | 04 | 32. | 01 |
| 03. | 03 | 13. | 03 | 23. | 03 | 33. | 02 |
| 04. | 02 | 14. | 02 | 24. | 01 | 34. | 04 |
| 05. | 04 | 15. | 03 | 25. | 04 | 35. | 03 |
| 06. | 01 | 16. | 01 | 26. | 03 | 36. | 01 |
| 07. | 03 | 17. | 03 | 27. | 01 | 37. | 03 |
| 08. | 02,03 | 18. | 02 | 28. | 02 | 38. | 04 |
| 09. | 04 | 19. | 03 | 29. | 04 | 39. | 02 |
| 10. | 03 | 20. | 04 | 30. | 01 | 40. | 02 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින் / புள்ளி வீதம்

**මුළු ලකුණු** / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

| නිවැරදි පිළිතුරු සංඛ්‍යාව<br>சரியான விடைகளின் தொகை | 25<br>40 | I පත්‍රයේ මුළු ලකුණු<br>பத்திரம் I இன் மொத்தப்புள்ளி | 25<br>40 |
|---|---|---|---|

අ.පො.ස(සා.පෙළ) විභාගය 2023(2024)

84 ශිල්ප කලා II

**II පත්‍රයේ I වන ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයකි. මෙම ප්‍රශ්නය තුළින් ශිල්ප කලා විෂය ධාරාවට අයත් සියලු නිපුණතාවයන්හි න්‍යායාත්මක හා ප්‍රායෝගික ක්‍රියාවලින් ඇගයීමට ලක්වන සේ ප්‍රශ්න කොටස් ඉදිරිපත් කරනු ලැබේ.**

**1.** ඔබ පාසලේ මෙවර පැවැත්වෙන නිවාසාන්තර මලල ක්‍රීඩා උත්සවයේ විසිතුරු කිරීමේ අවස්ථා සියල්ල ශිල්ප කලා අංශයේ සිසුනට පැවරීමට ක්‍රීඩා කමිටුව තීරණය කර ඇත.

(i) ක්‍රීඩා උත්සවය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීමට සුදුසු පෝස්ටරයක ආකෘතියක් ඇඳ දක්වන්න.

(ii) ආරාධිතයන් සඳහා යැවීමට ආරාධනා පත්‍රයක මුහුණතකට සුදුසු චිත්‍රයක් ඇඳ දක්වන්න.

(iii) වියමන් රටා ඇසුරින් නිවාස නාම සකස් කිරීමට යොදා ගත හැකි පන් වර්ග **දෙකක්** නම් කරන්න.

(iv) සමාරම්භක උළෙලේ නිවාස පුවරු රැගෙන යන ශිෂ්‍යයින්ගේ ඇඳුම් අලංකාර කිරීම සඳහා අච්චු මුද්‍රණ ක්‍රමයෙන් සකස් කර ගත හැකි මෝස්තරයක් චිත්‍රණය කර දක්වන්න.

(v) 'පරවි' නිවාසයේ සිසුන් හඳුනා ගැනීම සඳහා පැළඳීමට සුදුසු ලාංඡනයක රූප සටහනක් ඇඳ දක්වන්න.

(vi) සහතික පිරිනමන අවස්ථාවේ ක්‍රීඩකයින්ට දීමට යොදා ගන්නා, කෘත්‍රිම මල් සැකසුම් භාවිතයේ වාසි **දෙකක්** සඳහන් කරන්න.

(vii) විවේක කාලයේ දී නිවාස සාමාජිකයින්ට ලබා දෙන කෙටි ආහාරය අසුරාලීමට සුදුසු ඇසුරුමක රූපීය පෙනුම ඇඳ දක්වන්න.

(viii) තූර්ය වාදක කණ්ඩායමේ සාමාජිකයින්ට ගෙළ පැළඳීම සඳහා ආභරණ සැකසීමට යොදා ගත හැකි ස්වභාවික ඇට වර්ග **දෙකක්** ලියන්න.

(ix) නිවාස ධජයක් ඩිජිටල් මුද්‍රණය සඳහා රුපියල් අටසියයක් වැය වන අතර ධජ පහක් මුද්‍රණයේ දී 20% ක වට්ටමක් හිමි වේ. නිවාස ධජ පහ මුද්‍රණයට වැය වන මුදල ගණනය කරන්න.

(x) දක්ෂතම ක්‍රීඩකයින්ට/ක්‍රීඩිකාවන්ට පිරිනමන කුසලානය සඳහා සුදුසු ආකෘතියක් චිත්‍රණය කර දක්වන්න.

1. (i) තේමවට ගැලපෙන පෝස්ටරයක්, දිනය,වේලාව,ස්ථානය සඳහන් කර ඇඳ තිබීම.

(ලකුණු 02)

(ii) තේමාවට ගැලපෙන ආරාධනා පත්‍රයක මුහුණතට ගැලපෙන චිත්‍රයක් ඇඳ තිබීම

(ලකුණු 02)

(iii) ගල්ලැහැ
වැටකෙයියා
දුනුකෙයියා
තුන්හිරියා
ගොක් කොළ
පොල් කොළ
ඉඳි කොළ
තල් කොළ
ආදී පන් වර්ග දෙකක් නම් කිරීමට

(ලකුණු 02)

(iv) අච්චු මුද්‍රණයක් සඳහා කපාගත හැකි මෝස්තරයක් ඇඳ දැක්වීම (ලකුණු 02)

(v) පරවියාගේ සංකේතය හෝ නාමය ඇසුරින් ලාංඡනයක් ඇඳ දැක්වීම

(ලකුණු 02)

(vi) භාවිතයට පහසු වීම

ප්‍රවාහනයට පහසු වීම

නැවත නැවත භාවිතා කිරීමට හැකි වීම

සෑම ප්‍රදේශයකින්ම මිලදී ගත හැකි වීම

තැලීම් පොඩිවීම් වලට ඔරොත්තු දීම

අවශ්‍ය වර්ණවලින් ලබා ගත හැකි වීම

කරුණු දෙකක් ලියා දැක්වීම

**(ලකුණු 02**

(vii) ආහාර ඇසිරීමට සුදුසු රූපීය පෙන්නුමක් ඇඳ තිබීමට (භාණ්ඩයේ සාමාන්‍ය හැඩය)

**(ලකුණු 02)**

(viii) රබර් ඇට

දොඹ ඇට

මදටිය ඇට

ඔළිඳ ඇට

කී කිරිඳිය ඇට

පුස් ඇට

සියඹලා ඇට

ඉපිල් ඉපිල් ඇට

වැනි ස්වාභාවික ඇටවර්ග දෙකක් නම් කර තිබීමට

**දෙකක් නම් කිරීමට (ලකුණු 02)**

(ix) 800 x 5 -4000

$4000 \times \frac{20}{100} = 800$

4000-800=3200

රු.3200.00

පිහිටුවීමට ලකුණු 01 නිවැරදි පිළිතුරට ලකුණු 01

**(ලකුණු 02)**

(x) කුසලානයකට ගැලපෙන චිත්‍රයක් ඇඳ දැක්වීමට

**(ලකුණු 02)**

**(මුළු ලකුණු 20)**


2. **මෙම ප්‍රශ්නයට පිළිතුරු ලිවීමෙන් නිෂ්පාදන ක්‍රියාවලියේදී සැලසුම් චිත්‍ර ඇඳීමට භාවිතා කරන විශ්වීය භාෂාවක් වන ජ්‍යාමිතික හා යාන්ත්‍රික ඇඳීමේ මූලධර්මයන් ප්‍රායෝගිකව හා න්‍යායාත්මකව භාවිතා කිරීමේ හැකියාව ඇගයීමට ලක්කිරීමයි.**

2. භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලියේ දී සැලසුම් චිත්‍ර නිර්මාණයට ජ්‍යාමිතිය හා යාන්ත්‍රික ඇඳීම භාවිතයට ගනු ලබයි.


(i) කවකටුව හා කෝදුව භාවිතයෙන් පාදයක් 4 cm වූ ABC සමපාද ත්‍රිකෝණය නිර්මාණය කරන්න.

(ii) 7 cm වූ AB රේඛාව ඇඳ A සිට 4 cm ක් දුරින් පිහිටි ලක්ෂ්‍යයට ලම්භකයක් නිර්මාණය කරන්න.

(iii) රූපයේ දක්වා ඇති සිලින්ඩරයේ නිවැරදි මිනුම් අනුව විකසන චිත්‍රය ඇඳ දක්වන්න.




2. (i)




**නිවැරදිව ඇඳීමට**

**(ලකුණු 02)**

(ii)





**7 Cm රේඛාව ඇඳීමට (ලකුණු 01)**

**4 Cm ලක්ෂය ලකුණු කිරීමට (ලකුණු 01)**

**ලම්භකය නිර්මාණයට (ලකුණු 02)**

(iii)



**විකසන චිත්‍රය නිවැරදි මිනුම් අනුව ඇඳ දැක්වීමට**

**(ලකුණු 04)**

**(මුළු ලකුණු 10)**

3. අභිමතාර්ථ

**විසිතුරු භාණ්ඩ නිශ්පාදන ක්‍රියාවලියේදී අලංකරණය කිරීම සඳහා යොදාගන්නා විසිතුරු මැනුම් ක්‍රම, විවිධ මිශ්‍රන සකස් කිරීමේ ක්‍රම ශිල්ප පිළිබඳව න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම මැන බැලීම මින් අපේක්ෂා කෙරේ.**

3. ආකර්ෂණීය ලෙස නිම කරන ලද විසිතුරු භාණ්ඩ වර්තමාන වෙළෙඳපොළෙහි දක්නට ඇත.
   (i) ගෘහ අලංකරණ ලෙස රිබන් එම්බ්‍රොයිඩර් ක්‍රමය භාවිතයේ දී යෙදෙන මැහුම් ක්‍රම **දෙකක්** ලියන්න.
   (ii) කෘත්‍රිම ආභරණ නිර්මාණය සඳහා පාන්ක්ලේ මිශ්‍රණය සකස් කර ගන්නා ආකාරය දක්වා කාමි උවදුරු වැළැක්වීම සඳහා යොදන ආරක්ෂිත ක්‍රමවේදයක් දක්වන්න.
   (iii) තාප බන්ධිත ක්‍රමයට ඔබගේ පාසල් පොත් බෑගය අලංකාර කර ගැනීමට සුදුසු චිත්‍රයක් අඳින්න. එම ක්‍රමයට එය නිර්මාණය කර ගන්නා ආකාරය කෙටියෙන් දක්වන්න.

3. (i) රිබන් මැස්ම

කෙලින් මැස්ම

ලේසි ඩේසි මැස්ම

නැටි මැස්ම

ලූප් මැස්ම

ප්‍රංශ ගැට මැස්ම **(මින් ඕනෑම 02 ක් නම් කිරීමට ලකුණු 02)**

(ii) අවශ්‍ය ද්‍රව්‍ය

දිනක් පරණ පාන්

බයින්ඩර ගම්

කපුරු කුඩු

වර්ණක **(ලකුණු 02)**

දිනක් පරණ පාන් වල මැද කොටස ගෙන කොටස් වලට කඩා බයින්ඩර් ගම් මිශ්‍ර කර අනාගන්න.

පදම් වූ පසු කැමති හැඩයන් සකස් කර ගන්න.

අවශ්‍ය නම් වර්ණ ගන්වන්න.

කල් තබා ගැනීමට කපුරු කුඩු හෝ පල්මානික්කම් එකතු කරන්න.

හොඳින් වියළා ගන්න.

**(ලකුණු 02)**

(iii) පොත් බෑගයකට සුදුසු මෝස්තර ඇඳීම. **(ලකුණු 02)**

රෙදි කැබැල්ල පෙර පිරියම් කර හොඳින් මදින්න.

අවශ්‍ය මෝස්තරය මුද්‍රිත රෙදි කැබැල්ලකින් කපා ගන්න.

එය තාප බන්දිත කඩදාසි මත රෙදි කැබැල්ල තබා උණුසුම් ස්ත්‍රික්කයෙන් මදින්න.

එම කඩදාසියේ පිටු පසු කඩදාසි තිරුව ගලවා ඉවත් කරන්න.අනවශ්‍යකඩදාසි කොටස් කපා ඉවත් කරන්න.

එම කඩදාසි සහිත මෝස්තර කොටස බෑගයේ අවශ්‍ය තැනට තබා නැවත ස්ත්‍රික්ක කරන්න.

අවුට් ලයිට් භාවිතයෙන් නිමහම් කරන්න. **(ලකුණු 02)**

**මුළු ලකුණු 10**

4. **මෙම ප්‍රශ්නය මගින් රෙදිපිළි නිෂ්පාදනයේදී යොදාගන්නා වියමන් රටා හඳුනා ගැනීම,රෙදිපිළි නිෂ්පාදනයේ දී පිරිවැය ගණනය කිරීම,වියමන් රටා ප්‍රස්තාරගත කිරීම පිළිබඳ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම, ආකල් හා කුසලතා ඇගයීම අපේක්ෂා කෙරේ.**

4. බඳුන් පලස් (Table mat) හැදයක් සකස් කර ගැනීමට අවශ්‍ය නූල් හැදයක විස්තර පහත දැක්වේ.

- ❊ හැදයේ දිග මීටර් 50 කි.
- ❊ හැදයේ පළල සෙන්ටිමීටර් 20 කි.
- ❊ එක් සෙන්ටිමීටරයකට යොදන දික් නූල් ගණන 40 කි.
- ❊ දික් නූලේ අංකය $2^S$ / 40 ක් වේ.

(i) බඳුන් පලස් වියමට සුදුසු වියමන් රටා **දෙකක්** නම් කරන්න.

(ii) ඉහත (i) හි ඔබ නම් කළ වියමන් රටා දෙකෙහි නූල් මතුවීම ප්‍රස්තාරගත කර ඒවා නම් කරන්න.

(iii) බඳුන් පලස් හැදය වියමට අවශ්‍ය දික් නූල්වල බර ප්‍රමාණය ගණනය කරන්න.

4. (i) චාම් වියමන

ජටා වියමන

දික් දාර වියමන

හරස් දාර වියමන

සරලහිරි වියමන වැනි වියමන් රටා දෙකක් නම් කිරීමට

**රටා දෙකක් නම් කිරීමට** (ලකුණු 02)

(ii) නූල් මතු වීම ප්‍රස්තාර ගත කිරීමට (ලකුණු 02)

ඒවා නිවැරදිව නම් කිරීමට (ලකුණු 02)

(iii) කිලෝ ග්‍රෑම් වලින්

$$\frac{50 \times 20 \times 40 \times 2}{1000 \times 60} = 02 \text{ kg}$$

නූල් කැරලි ප්‍රමාණය

$$\frac{50 \times 20 \times 40}{1000} = \text{කැරලි } 40$$

නිවැරදිව සූත්‍රය පිහිටුවීමට (ලකුණු 02)

පිළිතුර නිවැරදිව ලබා ගැනීමට (ලකුණු 02)

(මුළු ලකුණු 10)

**5. රෙදිපිළි නිෂ්පාදනයේදී යොදා ගන්නා යන්ත්‍ර හා උපාංගයන්හි කාර්යය හඳුනා ගැනීමත්,පිළි අලංකරණ ක්‍රියාවලිය පිළිබඳ දැනුම ආකල්ප,කුසලතා න්‍යායාත්මක හා ප්‍රායෝගිකව ඇගයීම මෙමගින් අපේක්ෂිතය.**

5. වර්තමානයේ රෙදි පිළි අලංකරණය සඳහා විවිධ අලංකරණ ක්‍රම භාවිත කෙරේ.

(i) අතින් පින්තාරු කිරීමේ දී දම් පැහැය ලබා ගැනීම සඳහා මිශ්‍ර කළ යුතු මූලික වර්ණ මොනවා ද?

(ii) මුද්‍රණය කළ රෙදිවල සායම් ස්ථිර කිරීම සඳහා කරනු ලබන පසුපිරියම් ක්‍රම **දෙකක්** සඳහන් කර එයින් **එකක්** පිළිබඳ කෙටි සටහනක් ලියන්න.

(iii) බතික් නිර්මාණයකට සුදුසු චිත්‍රයක් ඇඳ එය **එක්** වර්ණයක් භාවිතයෙන් අලංකරණය කරන ආකාරය විස්තර කරන්න.

5. (i) දම් පැහැයට නිල් සහ රතු එකතු විය යුතුය. **(ලකුණු 02)**

(ii) උණුසුම් ස්ත්‍රික්කයකින් මැදීම

හුමාලකරණය

අව්වේ වියළීම

පවනේ වියළීම

ක්‍රම දෙකක් ලිවීමට **(ලකුණු 02)**

එක් පිළිතුරක් කෙටියෙන් විස්තර කිරීමට **(ලකුණු 02)**

(iii) චිත්‍රයක් ඇඳීමට

මෝස්තරය ඉටි කර ගැනීම

සායම් බඳුන් සකස් කිරීම

රසායනික ද්‍රව්‍ය නම් කර මිශ්‍රණය සැකසීම

ඩයි කිරීම (සායම් යෙදීම)

ඉටි ඉවත් කර ගැනීම

මඳ පවනේ වියළීම විස්තර කිරීමට **(ලකුණු 03)**

**මුළු ලකුණු 10**

6. **මෙම ප්‍රශ්නය මගින් මැටි නිර්මාණය වීම පදම් කිරීමේ ක්‍රියාවලිය හා ප්‍රායෝගික දැනුම මැ බැලීම අපේක්ෂා කෙරේ.**

6. ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට ම මැටි භාණ්ඩ නිෂ්පාදනය සඳහා උත්සාහ කර ඇති බව පැහැදිලිව දක්නට ඇ
   (i) මැටි නිර්මාණය වීම සඳහා බලපාන හේතු සාධක **දෙකක්** සඳහන් කරන්න.
   (ii) මැටි පදම් කර ගන්නා ප්‍රධාන ක්‍රම **දෙක** සඳහන් කර ඉන් **එක** ක්‍රමයක් පැහැදිලි කරන්න.
   (iii) මැටි තහඩු භාවිතයෙන් මල් බඳුනක් සකස් කර ගන්නා ආකාරය පියවර අනුව විස්තර කරන්න.

6. (i) සූර්ය තාපය

වර්ෂාව

විදුලි කෙටීම

ආර්ද්‍රතාව

හිම පතනය

ශාක හා සත්ත්ව ද්‍රව්‍යවල ක්‍රියාකාරිත්වය

ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරිත්වය

ඉහත කරුණු වලින් ඕනෑම දෙකක් සඳහා (ලකුණු 02)

(ii) ග්‍රාමීය වශයෙන් මැටි පදම් කිරීම

මහා පරිමාණ වශයෙන් මැටි පදම් කිරීම (ලකුණු 02)

ග්‍රාමීය ක්‍රමය

පාද හෝ දෑත් භාවිත කර පදම් කිරීම (ලකුණු 02)

මහා පරිමාණ ක්‍රමය

යන්ත්‍ර සූත්‍ර භාවිත කර ඇලෙනසුලු හා නොඇලෙනසුලු අමුද්‍රව්‍ය එකතුකර මැටි පදම් කිරීම.

(ලකුණු 02)

(iii) සමාන ඝනකමකින් මැටි තහඩුව සකස් කර ගැනීම

මැටි තහඩුවෙන් භාණ්ඩයට අවශ්‍ය පරිදි කොටස් කපා ගැනීම

කඩතොලු කර මැටි පාප්ප මගින් මැටි තහඩු කොටස් අලවා ගැනිම.

භාණ්ඩ සකස් කල පසු අනවශ්‍ය කොටස් කපා ඉවත් කිරීම.

මෝස්තර යොදා භාණ්ඩය විසිතුරු කිරීම.

(ලකුණු 04)

**7. මෙම ප්‍රශ්නය මගින් උද්‍යාන අලංකරණ ක්‍රියාවලියේ යොදා ගන්නා මාධ්‍ය ,ක්‍රම ශිල්ප හා අලංකරණ ක්‍රියාවලිය පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම,කුසලතා,ආකල්ප මැන බැලීම අපේක්ෂා කෙරේ.**

7. අප ජීවත්වන පරිසරය අලංකරණය කිරීම සඳහා විවිධ ක්‍රම භාවිත කෙරේ.

(i) උද්‍යාන අලංකරණ නිර්මාණ ශිල්පීය ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

(ii) කඩදාසි ආශ්‍රිත මැටි භාණ්ඩ අලංකාර කිරීමේ ක්‍රම **දෙකක්** දක්වා එයින් **එකක්** විස්තර කරන්න.

(iii) නිවසක අභ්‍යන්තරය අලංකරණයට සුදුසු මූර්තියක් සඳහා මාධ්‍යයක් නම් කර එම මූර්තිය නිර්මාණය කර ගන්නා ආකාරය විස්තර කරන්න.

7. (i) පූර්ණ උන්නක

අර්ධ උන්නක

අල්ප උන්නක

**මින් දෙකක් නම් කර තිබීම** (ලකුණු 02)

(ii) කොලාජ් ක්‍රමය

ඩෙකොපාජ් ක්‍රමය

පල්ප ක්‍රමය

**මින් දෙකක් නම් කර තිබීම** (ලකුණු 02)

**එකක් විස්තර කර තිබීම** (ලකුණු 02)

(iii) මාධ්‍ය - මැටි,පල්ප, ප්ලාස්ටර්ඔෆ් පැරිස් ලෝහ, දැව,සිමෙන්ති

මින් එකක් නම් කිරීමට (ලකුණු 01)

**එය විස්තර කර තිබීම** (ලකුණු 03)